




සහන් වීරසේකර

# එතුමා හෙවත් නාට්‍යමය උත්ප්‍රාසයේ රජු - විජය නන්දසිරි නම්වූ අසහාය රංගවේදියාණනි

මෙන්න දැන් ලැබුන පුවතක්. සියලූම නාලිකා ලෝකයට කෑ ගසයි. විකුම්සිරි මුණසිංහ නම්වූ ටෙලි වියනේ දග තරුව අව කැපෙන සටහනක් මුහුණු පොතේ තබා තිබුණා. බුද්දකගේ චිත්ත සුන්දරතාවය බිඳී ගියා. බැරිම තැන මහරගම කුමාරට ටෙලිෆෝන් කලා, කුමාරයාගේ ඉකිබිඳුම පරයා වචන පනින්න මොහොතකට වඩා ගත විය. මොහොතකට මා ලෝකය තුල අන්දමන්ද වී ඇති බව  පොඩි එකෙක් වගේ කුමාරගේ වැලපිල්ල ප්‍රත්‍යක්ෂ කලා. මෙන්න BREAKING NEWS ..විජය ආයි එනවාලූ. මොනවා…

53 වසරක වේදිකා ඉතිහාසයේ වේදිකාවෙන් ආරම්භවී සියලූ ප්‍රකාශන මාධ්‍යයන් ඔස්සේ චිත්‍රපට, ටෙලි සිත්තම් ඇතුළු රූපවාහිනි වැඩසටහන් පරාසයන් තුල වේදිකාවෙන් ලද පන්නරය දික්විජය කල ඔහු ඉලූක්පිටිය මුදියාන්සේලාගේ විජය නන්දසිරි නම් මහා සොඳුරු තෙමේ විය.  වෙනස ඔහු මිය යන්න මොහොතකට පෙර සිටියේ වේදිකාවේම විය. උත්ප්‍රාස රසය තුල චරිතය විසින් කරගන්නාවූ පටලවා ගැනීම ප්‍රේක්ෂකගාරය හඳුනා ගැනීමේ මතුවන රසය විජය විසින් අනෙකුකට දෙවෙන නොවන අයුරින් සාධනය කලේ, ඔහුගේ නික්ම යෑම සමගින් කලා ලෝකයේ විශාල හිඩැසක් තබමින්. වසර 53ක් වේදිකා ඉතිහාසයේ, ගෞරවනීය රංග විචාරයකට ලක් නොවුණු සුන්දර ප්‍රේම් ඔහු විය.

රියදුරු අසුනේ බුද්දකද විජය අනෙක් අසුනේ ලැගුම් ගෙන රස කතා වැපිරීම නාට්‍ය නඩයක් තුල දුර්ලභ මෙන්ම වරෙක ඉල ඇට කැඩෙන සම්ප්‍රදායක් බව ඔහුගෙන් වටහා ගනිමි. උත්ප්‍රාස රසය යනු දුර්ලබ රස කාරකයක් බවත් ලාංකීය නාට්‍ය කලාව තුල ඉහත රසය දැඩිව සහ අඩු නැතිව ජනිත කල වේදිකා නාටක අතර ප්‍රමුඛ ප්‍රකාශනයන් වනුයේ 70 දශකයේ බිහිවූ සයිමන් නවගත්තේගමගේ සුභ සහ යස වේදිකා නාට්‍යයයි, උත්ප්‍රාස රසය ලාංකීය කළ ලොවට හඳුන්වා දුන්නේ සුභ සහ යස තුලින්, විජේ එහි රඟපෑවා. 80 දශකයේ බිහිවූ ලූෂන් බුලත්සිංහලගේ ලතාරාවෝ ඉගිලෙති, තවත් අවස්ථාවක්, විජේ එහිත් රඟපෑවා. පසුව අපේ විජය විසින්ම නිෂ්පාදනය කළ කුස පබාවතී හි ජයම්පති ලෙස උත්ප්‍රාස රසය නැවත වේදිකාව තුල ජනනය කලා. එම නිෂ්පාදන සියල්ලේම විජය යනු උත්ප්‍රාස රස පිරි චරිත වලට පණ දුන් යෝදයෙක් විය.

විජය නන්දසිරි තුල පිහිටි ධීර ලලිත රංග ප්‍රසන්න ගුණය, අතිමහත්ය. මනමේ කුමරු ඔහුම විය. ධීර ලලිත ගුණයේ මහා ලක්ෂණ ඔහු මනමේ කුමරුගේ චරිතය තුලින් කැඩපතක් සේ අපට දැනේ. මනමේ කුමරුගේ චරිතය 27 වසරක් පුරාවට වැඩිම කලක් නිරූපණය කල දුර්ලභ මිනිසා වීමේ විය. මනමේ කුමරු සෝබමාන විය, රන් පැහැය ගැන්වූ  ලාලිත්‍ය දිස් වූ ආලෝක රශ්මි අතර බැබලෙන අපූරු චරිත පැතිකඩක් විය. විජය මනමේ රංගනය යෙදුනු අවස්ථා වල වේදිකාවේ දෙපස වතුර බේසම් දෙකක් විය. මන්ද චරිතය කිලිටි නොවීමට මනමේ කුමරුගේ චරිතය තුල මවන ධීර ලලිත ගුණය හීන නොවන්නට විජය වේදිකාවට සපැමිණි සෑම අවසථාවක් තුලම පාද දෝවනය විය. මන්ද මනමේ කුමරුගේ චරිත ප්‍රකාශනය තුල ප්‍රභාමය ලක්ෂණ  කිලිටි නොවීමට විජේ වග බලා ගත්තා. ඒ විජේ ය. සංස්කෘතික උත්තුංග රංග ප්‍රකාශය වගේම සරල  සුරුබුහුටි රංගන වින්‍යාසය තුල විජේ ලද පන්නරයම සහ වියුක්පත්තිය නැවත එවන් චරිතයක් පිළිබඳ අනාගත බොඳවූ සිහිනයක් අප තුල පසක් කරයි.

වරෙක විජේ අයියා යසට හැඳ පැලඳ සිනමා සම්මාන රාත්‍රියකට යනවා. කලින් දැනුම් දුන් පරිදි ඔහු ජනප්‍රිය නළුවා සම්මානයට හිමිකම් ලබන, ලැබෙමින් සිකුරා හතේ සිටි මොහොතක, අවසානයේ සම්මාන අවස්ථාවේ නිර්දේශිත නාමයන් අතරින් ඔහුගේ නාමය ලොප් වීම පුදුම සහගත විය. ඒ ලංකාවේ සම්මාන දෙන්නන්ගේ ආතල් එක උදෙසා මහා කැපකිරීම් කල කලාකරුවන් බයිට් කිරීමට හෝ සැහැල්ලූවට ලක් කිරීමට ගන්න පහත් උත්සාහයන් වේ. විජය අපි නැවත සම්මාන රාත්‍රියක දුටුවේ නැත, විජය සැහැල්ලූ හුරුබුහිටි ලෙස නික්ම ගියේය.

දෙයියොත් දන්නේ නෑ සමග adilaide නුවර වේදිකාගත වූ දින ඔහු ඉතා විඩාවෙන් සිටි නිසා නඩේ බොහෝ දෙනෙක් විජී අයියාට නවාතැනට යන ලෙස ඉල්ලා සිටියා. වේදිකාවේ පසුපස පත්තර කොලයක් එලා ගෙන "උබලා දාලා කොහේ යන්නද මං", කියා සුපුරුදු හුරුබුහුටි හිනාවෙන් අපට සංග්‍රහා කර ඇල වුනේ ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වය හෝ ලොකුකම් නොසිතා හුදෙක් වේදිකාව ඔහුගේ සදා යහන වූ බැවින් ද කියා මට සිතේ.

බුද්දක සමග මොහොතක් තනිවී ඔහුගේ අතීතය මෙනෙහි කලා. විජය අයියා ඉපදුණේ 1944 මැයි 6 වෙනිදා. ඉස්කෝලෙ ගියේ මහරගම විද්‍යාකර විද්‍යාලයට. හැදෙන ගහ පෙත්තෙන් දෙපෙත්තෙන් දැනේ කියන්න වගේ ඉස්කෝලෙ කාලෙදිම වේදිකා නාට්‍ය රංගනයට යොමුවෙන විජය නන්දසිරි තරුණයා, අවුරුදු 22 වෙද්දි ඒ කියන්නෙ 1966දි අමරදාස ගුණවර්ධන ශූරීන්ගෙ ඬව්දුර දිවඬ වේදිකා නාට්‍යයෙන් තමයි තමන්ගෙ ප්‍රසිද්ධ වේදිකා රංගන ජීවිතය පටන් ගන්නෙ. සිනහවෙන් තරුණ බව රැකෙනව කියල කියමනක් අහල ඇතිනේ. අන්න ඒ කියමන සනාථ කරන්න මෑත යුගයෙන් උදාහරණයක් දෙනව නම් දෙපාරක් හිතන්නෙ නැතුව  විජය නන්දසිරි නම කියන්න පුළුවන් කියලා මට හිතෙනවා. එදා නරිබෑනා නාට්‍යයෙත් අද සිකුරු හතේ හෝ Breaking News චිත්‍රපටයෙත් අපි දැක්කෙ හෝ දකින්නේ එකම හැඩහුරුවකින් එන මූණක්. ඒ මූණත් එක්ක ආපු දෙබස්, රඟපෑම් අපේ නෙත් සිත් පිනවපු අපූරුව(

වරෙක හොරෙව්පතාන සහ කැකිරාවේ රූප ගත කල කේ ඒ ඩබ්ලිව් පෙරේරාගේ චිත්‍රපටයේ මොරිස් මයිනර් රථයක් පදවා ගෙන යාමට විජේට භාර විය.

මල්ලි මට එතකොට ලයිසන් නෑ.



මගේ කුහුලද වැඩි විය.

එලෙව්වා මල්ලි මං එලෙව්වා..රියදුරු බලපත්‍රය ගන්නකම්ම එලෙව්වා.

ජයන්තදාස පෙරේරා ද සිහිපත් කරමින් මා දෙස බලා සිනා විය. එවකට සීයා කෙනෙකු වීම ඔහුගේ එකම බලාපොරොත්තුව විය. එය සපල විය. ඔහු තම මිණිබිරිය වත්මන් අදි තාක්ෂණයද යොදා ගනිමින්. අවසන් කාලයේ නාට්‍ය රඟ දැක්වීම් විරාමයකදී විජේ කළේම දරු සුරතල් බැලීම බව කුමාර, මිහිර, ගිහාන් ඇතුළු නඩේ සියල්ලම දනී. ඒ විජීය.

අවසන් කාලයේ ඔහු රංගනයෙන් දායක වූ සිකුරු හතේ සහ සුහද කොකා වැනි නිර්මාණ ප්‍රහසන සිනමාවේ ප්‍රදර්ශන වාර්තා තැබීමට සමත් විය. සිංහබාහු, මහාසාර ලලිතා සරච්චන්ද්‍ර නාට්‍යවේදිනියගේ කපුවා කපෝති සහ රත්නාවලී ඇතුළු එදා වේදිකාවේ රස මැවූ සම්මානනීය වේදිකා නාටක හා එක්ව සිය රංගනය ප්‍රතිභාව විදහා ලූ විජය නන්දසිරිගේ මල්වඩම් අනවශ්‍යයි, දෙයියොත් දන්නේ නෑ, බල්ලොත් එක්ක බෑ, රෑකඩ රාජ්ජේ සහ අලූත් හොරෙක් ඕනෑ නම්වූ ජනප්‍රිය වේදිකා නාට්‍ය සමඟින් මියෙන මොහොත තුරාවටම එක්ව සිටියේය.

"ඇත්තටම මිනිස්සු හිනස්සන එක සිතන තරම් පහුස කටයුත්තක් නොවෙයි. ප්‍රහසනය හරහා මිනිසුන්ගේ මොළය පිරිසිදු කිරීමත්, ලේ පිරිසිදු කිරීමත් කළ හැකියි. හැබැයි ඒක ඉතාමත් බැරෑරුම් කටයුත්තක්. ඒක හිතට වගේම හදවතටත් දැනිය යුතුයි. මා ඒ පිළිබඳව මා පුහුණුවක් ලැබුවේ වේදිකාව හරහා. ඊට පස්සේ මට ඒක පුංචි තිරයට වගේම රිදී තිරයටත් ගෙන එන්න අවස්ථාව ලැබුණා." බුද්දක සමග Adilaide නුවරදී පැවසුවා. විජේට වඩා විජේව දේවිකා බලා ගත්තා. අපි ඇස් දෙකට දැක්කා. ඇත්තයි.

එහෙත් විජේ වැඩියෙන්ම අඩපු දවස වුයේ සිය ආදරය දෝනිය, මනාලියක් වී ඉන්පසු ඔස්ට්‍රේලියාවට පදිංචියට නික්ම ගිය දවස. බොහෝ විට අප කියන්නේ දුවට මවක මිස කියා, ඒත් විජේ යනු තම දියණියට අසීමිතව කොන්දේසි විරහිතව ආදරය කිරි කල පියෙක්. ලෝකයේ දුවකුට උත්කෘෂ්ට ලෙස පිය ආදරය පූජා කල පියෙක් සොයයි නම්  ඒ උත්තරයේ නිමාව විජය නන්දසිරිම විය යුතුය.

"සුදු අයියා…"

මල්වඩම් අනවශ්‍යයි.. නැවත එන්න